# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2375/22 - 2024 මාර්තු මස 12 වැනි අඟහරුවාදා - 2024.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 62877 දරන සහ අංක 482/බී, මිලේනියම් ඩ්‍රයිව්, මාලඹේ යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 සැප්තැම්බර් මස 07 දින අංක 2348/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "අධ්‍යාපනපති උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (SLQF 6 වන මට්ටම) දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යාව විෂය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණය විෂය ධාරාවෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

   (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ එම අවස්ථාවේදී හෝ වෙනත් අවස්ථාවකදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයය සඳහා සාමාන්‍ය

1A - PG 6672 — 284 (2024/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සාමාර්ථයක් (එස්) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ඇ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇදුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධිය* | *II වැනි තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| දත්ත විද්‍යාව පිලිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (දත්ත විද්‍යාව) |

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2024 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 - 0116/1

---

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන, සහ මිලේනියම් ඩ්‍රයිව්, අයි.ටී. පාර්ක්, මාලඹේ, 10115 උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලැබූ 2023 ජුලි මස 31 වන දින අංක 2343/03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ I වන උපලේඛනයේ, එහි I(අ) වන කොන්දේසිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ.

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

(අ) අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්.එල්.කියු.එෆ්. 6 වන ස්ථරයේ) ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබද අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් (එස්) සාමාර්ථ තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම සහ පාසල් හෝ කලාප හෝ ජාතික හෝ පළාත් හෝ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාවල ජයග්‍රහණය ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2024 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 - 0116/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.